# වෘත්තීය සමිති ලියාපදිංචි කිරීමට හා අදාළ උපදෙස්

සාමාන්‍ය:

- සංගමයේ ලියාපදිංචි කිරීම සඳහා අවම සාමාජික සංඛ්‍යාව 07කට වැඩිවිය යුතුය.
- වෘත්තීය සංගමය පිහිටුවා මාස 03ක් ඉක්මවා යාමට ප්‍රථම ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කළ හැකිය.
- රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ සේවකයන්ට එක්ව වෘත්තීය සමිතියක් පිහිටුවා ගත නොහැක.

" B" ආකෘති පත්‍රය හා ව්‍යවස්ථා මාලාව

1. ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරනු ලබන " B" ආකෘති පත්‍රයේ හා ව්‍යවස්ථා මාලාවේ සම්පූර්ණ කරනු ලබන සෑම ස්ථානයකම ලේකම්වරයා විසින් කෙටි අත්සන් යෙදිය යුතු අතර සම ලෙක්ම්වරු පත්ව ඇති අවස්ථාවන්හිදී සමලේකම්වරුන් සියලු දෙනාගේම කෙටි අත්සන් යෙදිය යුතුය.

2. i.ලියාපදිංචි කිරීමේ ඉල්ලුම් පත්‍රය ("B" ආකෘතිය) සමඟ සමිතියේ ආරම්භක රැස්වීම් වාතර්‍ාව සහ රැස්වීමට සහභාගී වූ සාමාජික අත්සන් නාම ලේඛණය ඉදිරිපත් කළ යුතුය.

   ii.එම අත්සන් ලේඛණයෙහි පහතින් දක්වා ඇති විස්තර පැහැදිලිව හා නිරවද්‍යාව සඳහන් කර තිබිය යුතුය.

   - සාමාජිකයාගේ නම
   - ජාතික හැඳුනුම්පත් අංකය
   - පෞද්ගලීක ලිපිනය
   - රක්ෂාව
   - රාජකාරී ලිපිනය
   - සේවක අංකය
   - සේවක අර්ථ සාධක අරමුදල් අංක ඇත්නම් එම අංක
   - පෞද්ගලික අංශයේ වෘත්තීය සමිතියක් නම් , එක් එක් සාමාජිකයාට අදාළ සේවායෝජකගේ විස්තර

3." B" ආකෘති පත්‍රයේ,

i.අදාළ කොටසෙහි අවලංගු නොකළ රු.50.00ක් වටිනා මුද්දර ඇලවිය යුතුය.

ii. ඉල්ලුම්කරුවන්ගේ අත්සන් යෙදිය යුතු ස්ථානයේ අදාළ මහ සභා රැස්වීමට පැමිණි සිටි සාමාජිකයන් අතුරින් 07 දෙනෙකුගේ අත්සන් යෙදිය යුතු අතර ඔවුන්ගේ විස්තර (1) වැනි උපලේඛනයේ (අ) කොටසෙහි සඳහන් කළ යුතුය.

iii. (1) වැනි උප ලේඛනයේ (ඉ) කොටස යටතේ සමිතියේ නිලධාරී මණ්ඩලයට අයත් නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිනයන් සඳහන් කළ යුතුය.

4.ව්‍යවස්ථා මාලාවේ අංක (06) (අ) හා (08) අනුව රැස්වීම්වලදී සණ පූර්ණය පැහැදිලිව සටහන් කළ යුතුය.

5.ලියාපදිංචියෙන් පසු නිලධාරී වෙනස්වීම්, වාෂර්ික වාතර්‍ා ඉදිරිපත් කිරීම්, ව්‍යවස්ථා වෙනස් කිරීම්, කායර්‍ාල ලිපිනයේ වෙනස් කිරීම්, විසුරුවා හැරීම් හා ඒකාබද්ධ කිරීම් යන කරුණු වලදී අවශ්‍ය වන අදාළ පොමර්‍යන් මෙම අංශයෙන් ලබා ගත හැකි වේ.

වැඩිදුර විස්තර සඳහා :-

දුරකථන අංකය : 0112368107

ඊමේල් ලිපිනය : tradeunion@labourdept.gov.lk

ලිපිනය : සහකාර කම්කරු කොමසාරිස්,<br>වෘත්තීය සමිති අංශය,11 වන මහල,<br>මෙහෙවර පියෙස ගොඩනැගිල්ල,<br>කම්කරු දෙපාතර්මේන්තුව, කොළඹ 05.